සැ. යු. — 2016.01.14 දින පළ වූ අංක 1,950 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,951 - 2016 ජනවාරි මස 22 වැනි සිකුරාදා - 2016.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 474 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 478 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය** පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 පෙබරවාරි මස 12 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

සංශෝධනය කිරීමයි

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

වරිපනම් බදු පනවා අය කිරීම 2016

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන විමලා අබේකෝන් වන මා විසින් තීරණ අංක 446 යටතේ තීරණය කළ හා අංක 1940 හා 2015.11.06 වන දින ගැසට් පත්‍රය මගින් නිවේදනය කළ 2016 වර්ෂයට වරිපනම් බදු පැනවීමේ නිවේදනය මෙයින් අවලංගු කරන අතර, එය පහත පරිදි සංශෝධනය කර නැවත නිවේදනය කිරීම සඳහා ඉදිරිපත් කරමි.

විමලා අබේකෝන්,
ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 23 වැනි දින.

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

වරිපනම් බදු පනවා අය කිරීම 2016

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන විමලා අබේකෝන් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය ප්‍රකාර එම පනතේ 134(1) වැනි උප වගන්තිය ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2016 වසරට අදළ වරිපනම් බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2015.12.23 වැනි දින තීරණ අංක 853 යටතේ ලබාගත් බව මෙයින් නිවේදනය කරමි.

විමලා අබේකෝන්,
ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 23 වැනි දින.

**තීරණය**

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් විමලා අබේකෝන් (බලතල/කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී) වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උප වගන්තිය ප්‍රකාර 2016 වසරට අදළ වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) උප වගන්තිය ප්‍රකාර කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශිත/දැනට වරිපනම් බදු අය කරනු ලබන ප්‍රදේශයේ ඇතුලත පිහිටියා වූ නිවාසවල/ගෙවල් ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම වන 2015 වර්ෂයේ අලුතින් කරන ලද නව තක්සේරුව/සත්‍යෙක්ෂණය 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යෙක්ෂණය ලෙස පිළිගැනීමටත් එම නව තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත සඳහන් තක්සේරු වටිනාකමින් 6% ක් වූ වරිපනම් බද්දක් නියම කලයුතු බවටත්,

තව ද 2016 වර්ෂයට ගෙවිය යුතු වාර්ෂික වරිපනම් බදු මුදල එම වසරේ ජනවාරි 31 දිනට පෙර ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දෙන් 10%ක වට්ටමක්ද වාර්ෂික වරිපනම් බදු මුදල කාර්තු වශයෙන් ගෙවන්නේ නම් පහත උපලේඛනය පරිදි වට්ටම් ලබා දිය යුතු බවටත්, ප්‍රාදේශීය සභා පනතේ 134(6)/134(7) වගන්තිය ප්‍රකාර තීරණය කරමි.

*උපලේඛන අංක*

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු කාර්තුව | 2016.01.01 | 2016.01.31 |
| දෙවන කාර්තුව | 2016.04.01 | 2016.04.30 |
| තුන්වන කාර්තුව | 2016.07.01 | 2016.07.31 |
| හතරවන කාර්තුව | 2016.10.01 | 2016.10.31 |

01-630

---

**තලවාකැලේ ලිඳුල නගර සභාව**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

**නිවේදනය**

***1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත***

261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184(අ) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. පී. අජිත් පුෂ්පකුමාර,
ලේකම්,
තලවාකැලේ ලිඳුල නගර සභාව.

2015 දෙසැම්බර් මස 30 වැනි දින.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.08 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට තලවාකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

01-658

### වාරියපොල ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනත)

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන(සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභාවේ යාපා මුදියන්සේලාගේ සේනානායක වන මම,

* ප්‍රාදේශීය සභා කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව;
* වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව;
* අදහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව;
* අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථාවන්

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2015.12.17 දිනැති තීරණ අංක 850 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

වයි. එම්. සේනානායක,
ලේකම් හා බලතල කාර්ය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
වාරියපොල ප්‍රාදේශීය සභාව.

#### තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 වන දින අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) වැනි කොටසේ පළ කරනු ලැබුවා වූ -

* ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව;
* වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව;
* ආදහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව;
* අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම

සඳහා වන අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථාවන් හතර (04) 1957 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාවේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

01-881

### වරකාපොල ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ 03 වැනි උපවගන්තියේ වරකාපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 වර්ෂයේ ජූලි මස 28 වැනි දින පවත්වන ලද වරකාපොල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 06-02-02 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

බී. ඒ. සී. කීර්තිසිරි විජේතුංග,
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2015 ක් වූ ජූලි මස 28 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

#### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ 03 වැනි උපවගන්තියේ වරකාපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, වරකාපොල ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූද -

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ 03 වැනි උපවගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හෙක්ටයාර් 05ට අඩු නමුත් හෙක්ටයාර් 01 හෝ ඊට වැඩි ඉඩමක් සඳහා හෙක්ටයාරයකට 2016 වර්ෂය සඳහා රු. 50.00 ක බද්ද ක් ද,

*(ආ)* හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයකටම 2016 වර්ෂයට රු. 10.00 බැගින් වන වාර්ෂික බද්දක් ද අය කළ යුතු යැයි යෝජනා කරමි.

*(ඇ)* 2016 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යනදින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුලදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

*(ඈ)* 2016 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2016 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (05%)ක වට්ටමක්ද ගෙවනු ලැබේ.

*(ඉ)* තවද, නියමිත කාර්තුව තුළ අදළ අක්කර බදු නොගෙවන්නේ නම් 10%ක (අධිගාස්තු) දඩ මුදලක් අයකළ යුතු බවද සභාව යෝජනා කළ බව මහජනයා වෙත දන්වා සිටින ලදී.

01-639

**මහනුවර මහ නගර සභාව**

1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත

*"එලිපන්ට් බාත් පැසේජ් මාවත"*

2011.12.21 වැනි දින පැවති මහ සභා රැස්වීමේදී අංක 08.(44) දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කර ඇත.

02. (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥාපනතේ 7(11) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි මධ්‍යම පළාත් සභාවේ මහ ඇමතිතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත, "එලිපන්ට් බාත් පැසේජ් මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
මහනුවර නාගරික කොමසාරිස්.

*උපලේඛනය*

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | - | මහනුවර මහ නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | - | මහනුවර |
| 03. | වීථියේ වර්තමාන නම | - | නැත |
| 04. | අලුතින් යොදා ඇති නම | - | "එලිපන්ට් බාත් පැසේජ් මාවත" |
| 05. | මාර්ග විස්තරය | - | ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවතේ The Fair Heven හෝටලය ඉදිරියෙන් වමට හැරී යන මාර්ගය. (වරිපනම් අංක 47 දරන ස්ථානය) |

01-733

---

**අකුරලිය ප්‍රාදේශීය සභාව**

1893 අංක 9 දරන ගෝ ඝාතක ආඥාපනත අනුව

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ, 2016 වර්ෂයේ මස් වෙළඳාම හා ගව ඝාතකාගාර වශයෙන් කරගෙන යාම සඳහා වාර්ෂික බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම බලපත්‍රය නිකුත් කිරීම ගැන අකුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු සඳහාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බවත්, ගෝ ඝාතක ආඥාපනතේ අංක 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කේ. පී. පේමවතී,
ලේකම්,
අකුරලිය ප්‍රාදේශීය සභාව,
අකුරලිය.

2015 දෙසැම්බර් මස 29 වැනි දින,
අකුරලිය ප්‍රාදේශීය සභාව.

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *වෙළඳාම* | *ගවමස් වෙළඳසැල* | *ගෝ ඝාතකාගාරය* |
|---|---|---|---|
| එම්. එච්. එම්. නව්සාඩ්<br>අංක 95,<br>ගොඩවත්ත පාර<br>ගොඩපිටිය. | ගවමස්<br>විකිණීම | ගොඩපිටිය<br>ගලපිලාගමලියද්ද<br>ඉඩම | උඩුවරගෙවත්ත<br>ගොඩපිටිය |

01-631

## මහනුවර මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබා දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වෙන සමාජ ශාලාවක් එහි සඳහන් ස්ථානයන්හි පැවැත්වීම සඳහා 2016 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම පිණිස මා වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාවක් අසල හෝ එකී සමාජ ශාලාවන් සඳහා අපේක්ෂිත ස්ථානයක් අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට සති 04 ක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම* | *සමාජ ශාලාවේ සභාපති ද ලේකම්ද යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|
| ලේකම් | ලේකම් | ද කැන්ඩි ගාඩින් ක්ලබ් | අංක 09, සංඝරාජ මාවත මහනුවර. |

මහනුවර පුරපති.

2015 දෙසැම්බර් මස 30 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

01-636

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 37 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 37 (1) "ආ" වගන්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් අංක 1922 දරන 2015.07.03 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කර පල කරන ලද පහත සඳහන් මාර්ගය ඉදිරියෙන් දක්වා ඇති දිග හා පළල අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු දේපළක් ලෙසට සලකා නඩත්තු කරනු ලබන බවට ප්‍රසිද්ධ කරනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2016 ජනවාරි මස 07 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

| *අනු. අංකය* | *පාරේ නම* | *මායිම් සීමාව සිට දක්වා* | *දිග* | *පළල* |
|---|---|---|---|---|
| 01 | නුගේගොඩ දේවාල පාරේ සිට ස්ටැන්ලි තිලකරත්න මාවත (කෝට්ටේ පාර) දක්වා දිවෙන මාර්ගය | ව. අංක 38බී, 38/1, 38/2, 38/3, 38/5 දක්වා | අඩි 192 | 15 සිට 20 දක්වා |
| | | ව.අංක 231, 231/1, 233, 231/2, 233/2 | 153 | අඩි 15 |

01-885

# විවිධ දැන්වීම්

**අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ ජල ගාස්තු අය කිරීම - 2016

**ජල ගාස්තු අය කිරීම**

උක්ත කාරණය යටතේ 2015 නොවැම්බර් මස 27 වැනි සිකුරාද දින අංක 1943 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* මා විසින් පළ කරන ලද *ගැසට් නිවේදනය* අවලංගු කර එය පහත සඳහන් පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ ජල ගාස්තු අය කිරීම - 2016

ජල ගාස්තු අය කිරීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සකස් කරන ලද 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරන ලද්ද වූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 34 ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාවලට අනුව අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන ජල යෝජනා ක්‍රම සඳහා 2016 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ජල ගාස්තු අයකර ගැනීමට තීරණය කරන ලදී. මෙම තීරණය 2015.12.31 දින තීරණ අංක 484 යටතේ සටහන් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

**වෙනත්**

01. *පොම්පීය ජල යෝජනා ක්‍රම*
    රංමුතුගම

02. *ගුරුත්ව ජල යෝජනා ක්‍රම*
    කුඹල්ඔළුව
    මොරගහමඩ
    රත්තොටමලේ
    කුකුරුමාන
    ඇහැලගස්තැන්න
    සිරංගහවත්ත

01. *පොම්පීය ජල යෝජනා ක්‍රම සඳහා*
    ස්ථාවර ගාස්තුව රු. 150 ක් වන අතර, ප්‍රයෝජනයට ගන්නා සෑම ඒකකයක් සඳහාම රු. 35 බැගින් අය කෙරේ.

02. මණු සවිකර ඇති ගුරුත්ව ජල යෝජනා ක්‍රම සඳහා

    ස්ථාවර ගාස්තුව රු. 100 ක් වන අතර ප්‍රයෝජනයට ගන්නා පළමු ඒකක 10 සඳහා 01 ඒකකයක් රු. 15 බැගින් ද හා එකොළොස් වන ඒකකයේ සිට සෑම ඒකකයක් සඳහාම රු. 20 බැගින්ද අය කෙරේ.

03. ජල මණු සවිකර නොමැති ගුරුත්ව ජල යෝජනා ක්‍රම සඳහා මසකට රු. 150 බැගින් ස්ථාවර ගාස්තුවක් අය කෙරේ.

කේ. ජී. චන්ද්‍රසිරි,
ලේකම්,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 31 වැනි දින,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-637

**බුත්තල ප්‍රාදේශීය සභාව**

ගාස්තු පැනවීම

බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වූ පහත උපලේඛනයේ සඳහන් සහතික හා ලියකියවිලි සම්බන්ධව 2016.01.01. දින සිට නැවත මේ පිළිබඳව දැන්වීමක් කරන තෙක් පහත විස්තර වනගාස්තු ප්‍රමාණයන් පනවා අය කිරීම සුදුසු බව මෙම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. ඒ. පී. දිසානායක,
සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 01 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *කාරණය* | *ගාස්තු ප්‍රමාණය* |
|---|---|---|
| 01. | ඉඩම් සැලැසුම් අනුමත කිරීමේ ගාස්තු | රු. 1000 |
| 02. | අනුකූලතා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු | නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009.04.17 දරන අති විශේෂ *ගැසට් පත්‍රය* ප්‍රකාරව |
| 03. | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු | රු. 500 |
| 04. | ඉඩම් අනු කොටස්වලට බෙදීමේ අයදුම්පත් ගාස්තු | රු. 300 |
| 05. | ගොඩනැගිලි අයදුම්පත් කාලය දීර්ඝ කිරීම | රු. 500 |
| 06. | පෙරසැරි ගාස්තු | නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009.04.17 දරන අති විශේෂ *ගැසට් පත්‍රය* ප්‍රකාරව |
| 07. | ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම (පර්චස් 1 ක් සඳහා) | රු. 500 හා නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009.04.17 දරන අති විශේෂ *ගැසට් පත්‍රය* ප්‍රකාරව |
| 08. | අනුමත ගොඩනැගිලි සැලසුම් සහතික කළ පිටපතක් ලබා ගැනීම සඳහා | රු. 1,000 |

01-687

---

## නිවැරදි කිරීමයි

**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**

2015.12.11 දින අංක 1945 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ)-විවිධ දැන්වීම් යටතේ 12-426/3 දරන නිවේදනයේ 1 හා 2 ඡේදයන් හි 2016 වර්ෂයට අදාළව කර්මාන්ත බදු ලෙස සඳහන් වී ඇත. එය ව්‍යාපාර බදු ලෙස නිවැරදි විය යුතුය.

එම්. ඒ. පුන්‍යා කුමාරි,
ලේකම්,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව.

2016 ජනවාරි මස 05 වැනි දින,
ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ දී ය.

01-709/1

## නිවැරදි කිරීමයි

### ඉපලෝගම ප්‍රාදේශීය සභාව

2015.12.11 දින අංක 1945 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ)-විවිධ දැන්වීම් යටතේ 12-426/7 දරන නිවේදනයේ පළමු ඡේදයේ ව්‍යාපාර බදු ලෙස සඳහන් වී ඇති කොටස කසල බදු ලෙස නිවැරදි විය යුතු ය.

එම්. ඒ. පුන්‍යා කුමාරි,
ලේකම්,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව.

2016 ජනවාරි මස 05 වැනි දින,
ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ දී ය.

01-709/2

---

### ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. එම්. පුෂ්පලතා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2015 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයට ව්‍යාපාර බද්දක් 2016 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

ජේ. එම්. පුෂ්පලතා,
ලේකම්,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 16 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ.

*උපලේඛනය*

| | *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|---|
| | *2015 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *රු. ශත* |
| 01. | රු. 6,000 නොඉක්මවන විට | නැත |
| 02. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 03. | රු.12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 04. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 300 0 |
| 05. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 06. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

01-738/2

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2016 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. එම්. පුෂ්පලතා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙයි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2016 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

ජේ. එම්. පුෂ්පලතා,
ලේකම්,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 16 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

### උපලේඛනය

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල්* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | අභ්‍යාස පොත් නිපදවීම | | | |
| 02. | කඩදාසි බෑග් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | පැණි නිපදවා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | මදුරුදැල් මසා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | සිමෙන්ති භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ජී. අයි. බාල්දි නිපදවා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | පාවහන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ප්‍රචාරක දැන්වීම් පුවරු/බැනර් සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | තෙල් මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | යෝගට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බෙලෙක් වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ඇඳ ඇතිරිලි, කොට්ටඋර නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ඇඳුම් මැසීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මැටි භාණ්ඩ නිපදවීම/අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ඇඟළුම් කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | මහා පරිමාණයේ කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | තේ කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |

01-738/1

**වත්තේගම නගර සභාව**

2015.12.18 දින පළ කරන ලද අංක 1946 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ)-විවිධ දැන්වීම් යටතේ පළකරන ලද නිවේදනයන්හි සංශෝධනයන් පහත පරිදි සිදු විය යුතුයි.

- 2015.12.18 වැනි දින පලකරන ලද පිටු අංක 3437, 3440, 3441, 3442, 3446 සඳහන් වත්තේගම නගර සභාවේ *ගැසට්* නිවේදනයේ 2015 නොවැම්බර් මස 04 වැනි දින තීරණ අංක 198 යනුවෙන් සඳහන් කර ඇති කොටස්

  2015 නොවැම්බර් මස 09 වැනි දින තීරණ අංක 205 යනුවෙන් සංශෝධනය විය යුතු ය.

- 2015 නොවැම්බර් 04 වැනි දින වත්තේගම නගර සභා කාර්යාලයේ දී යනුවෙන්ද සඳහන් වන කොටස්

  2015 නොවැම්බර් මස 09 වැනි දින වත්තේගම නගර සභා කාර්යාලයේ දී යනුවෙන් සංශෝධනය විය යුතු ය.

- පිටු අංක 3443 හි ජල ගාස්තු අය කිරීම වශයෙන් සඳහන් කොටස

  මනු කුලියට අමතරව යන ඒකක සඳහා පහත පරිදි ය.

  1. ගෘහස්ථ කටයුතු සඳහා හා පාසැල් සඳහා -

| *ඒකක* | *ඒකකයට අය කිරීම රු. ශත* |
|---|---|
| 0-12 | 11.50 |
| 13-17 | 15.00 |
| 18-22 | 18.00 |
| | 23 සිට සෑම ඒකකයකට රු. 20.00 බැගින් යනුවෙන් ද සංශෝධනය විය යුතු ය. |

- පිටු අංක 3442 සඳහන් 2016 වර්ෂයේ වරිපනම් බදු කොටසේ 1 වන ඡේදයේ 2014.09.29 දින යන කොටස 2015.11.09 දින තීරණ 205 යටතේ යනුවෙන් සංශෝධනය විය යුතු ය.

- පිටු අංක 3446 හි 2015 වර්ෂය සඳහා විනෝද බදු යන කොටස 2016 වශයෙන් ද සංශෝධනය විය යුතු ය.

පී. එස්. බී. මඩුගල්ලේ,
ලේකම්/කාර්ය, කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2016 ජනවාරි මස 04 වැනි දින,
වත්තේගම නගර සභාවේ දී ය.

01-799

---

**හලාවත ප්‍රාදේශීය සභාව**

2016 වර්ෂය සඳහා සේවා ගාස්තු අය කිරීම

2015.12.18 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* IV(ආ) කොටසේ පලකරන ලද 2016 වර්ෂය සඳහා සේවා ගාස්තු අය කිරීම නම් වූ *ගැසට් නිවේදනයෙහි* අංක 02 යටතේ වූ ජලනල එලීම සඳහා මාර්ග පලුදු කිරීම සම්බන්ධව වන ගාස්තු 2015.12.03 දින පැවති කළමනාකරණ කමිටු තීරණ අංක 04 යටතේ පහත පරිදි සංශෝධනය කර අය කිරීම සුදුසු බවට තීරණය කරන ලද අතර එම තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඩී. ඉලංකෝන්,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් නව ජල සැපයුම් ලබා දීමේ දී හලාවත/මාදම්පේ ජල සම්පාදන ක්‍රමයන්හි ස්ථානභාර නිලධාරීන්ගේ ඉල්ලීම අනුව, හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැලි/බොරළු/තාර/කොන්ක්‍රීට්/කොන්ක්‍රීට් කුට්ටි/ප්‍රීමික්ස් මාර්ගයන් හෝ මාර්ගයන්හි උරහිස පලුදු කිරීම්, කාර්මික නිලධාරීන්ගේ නිර්දේශයෙන් එම ස්ථාන අලුත්වැඩියා කිරීමේ ගාස්තු පහත සඳහන් ලෙස පාරිභෝගිකයන්ගෙන් අයකර අවසර ලබා දෙනු ලැබේ.

| *මාර්ගය/මාර්ග උරහිස* | *වර්ග අඩි එකක් සඳහා(රු.)* | *වර්ග මීටර් එකක් සඳහා (රු.)* |
|---|---|---|
| වැලි/බොරළු | 25.00 | 270.00 |
| තාර | 145.00 | 1,560.00 |
| කොන්ක්‍රීට් | 200.00 | 2,152.00 |
| කොන්ක්‍රීට් කුට්ටි | 215.00 | 2,313.00 |
| ප්‍රීමික්ස් | 100.00 | 1,076.00 |

03. ජල සැපයුම් දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිවල දී, කාර්මික නිලධාරි නිර්දේශයට අනුව එම ව්‍යාපෘතියේ මාර්ග පලුදු කිරීම්වල අලුත්වැඩියා කිරීමේ ගාස්තුව රු. 5,000.00 ක් හෝ ඊට වැඩි වන අවස්ථාවල දී පමණක් රු. 5,000.00 ක් ආරක්ෂිත තැන්පත් වශයෙන් මාර්ග පලුදු කරන ජල ව්‍යාපෘතිය ලබා ගැනීමට අපේක්ෂිත අයගෙන් ලබා ගෙන එම තැනැත්තන් විසින් මාර්ග පලුදු කිරීම් අලුත්වැඩියා කර යථා තත්වයට පත් කරන බවට ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, ඒ සඳහා අවසර ලබා දීම සහ කාර්මික නිලධාරි පරීක්ෂාවෙන් පසු මාර්ග පලුදු කිරීම් යථා තත්වයට පත් කර ඇති බව නිරීක්ෂණ වාර්තාව මගින් සනාථ වන්නේ නම්, අදාළ පුද්ගලයන්ට ආරක්ෂිත තැන්පත් ආපසු ලබා දීම සිදු කරනු ලැබේ.

01-870

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.